**අත්තනගල්ල ප්‍රාදේශීය සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**

--------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-------------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 22 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභා අරමුදලින් ඉදිකර තිබූ හොරගොල්ලාගම මාතෘ / ළමා නිවාසයේ ආරක්ෂිත වැට වෙනුවෙන් ප්‍රතිපූර්ණය වියයුතු රු.1,714,526 ක් ණයගැති ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රු.1,640,302 ක් වටිනා වත්කම් 03 ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වේයන්ගොඩ පැරණි සතිපොළේ වටිනාකම රු.1,004,016 ක් වත්කම් ගිණුමෙන් ඉවත්කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2017 වර්ෂයේ ප්‍රාග්ධනිත කරන ලද ක්‍රියාත්මක නොකළ රු.5,253,187 ක් වූ ව්‍යාපෘති 13 ක වටිනාකම ගිණුම් වලින් ඉවත්කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ගෙවීම්කර තිබූ රු.74,869 ක් වටිනා කර්මාන්ත තැන්පතු 02 ක් තැන්පත් ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | පළාත් සභා ව්‍යාපෘති 02 කට සහ ගම්පෙරළිය ව්‍යාපෘති 03 කට අදාලව පිළිවෙලින් රු.37,813 ක් සහ රු.527,006 ක් ණයහිමි ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | සභා ව්‍යාපෘති 05 කට අදාලව රු.1,232,022 ක් ණයහිමි ගිණුමේ වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඌ) | සභාවේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් මිලදීගන්නා ලද රු.1.310,000 ක් වටිනා ජංගම දූරකථන 53 ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 08 කට අදාලව ප්‍රතිපූර්ණය වියයුතු රු.26,642,865 ක් ණයගැති ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වත්කම් වල අයිතිය තහවුරු කෙරෙන ලිපි, උපලේඛන හා ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.184,569,452 ක් වූ වත්කම් විෂයන් හතරක් හා වගකීම් විෂයන් දෙකක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | පෙන්වා දී ඇති විගණන සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වේ. | ලේඛන යාවත්කාලීන කරමින් පවතී. |

**1.3.3 නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව විවිධ තැන්පතු වල ආරම්භක ශේෂයේ රු.2,685,847 ක වෙනසක් පැවතුණි. | ආරම්භක ශේෂ වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගැලපිය යුතු වේ. | ආරම්භක ශේෂයන් ඉදිරියට ගෙන ඒමේදී ඇති වූ මෙම වෙනස නැවත පරික්ෂා කරමි. |

1.4 **අනුකූල නොවීම්**

**--------------------**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**------------------------------------------------------------------------------**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ----------------------- | -------------------- | ---------------- | -------------------------------- |
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරණ පනත, 20 වගන්තිය | වර්ෂ 05 කට වරක් වරිපනම් බදු තක්සේරු කරවාගතයුතු වුවද උපකාර්යාල 2කට අදාලව 2009 වර්ෂයෙන් පසු තක්සේරුව සිදුකර නොතිබුණි. | වසර 05 කට වරක්වත් වරිපනම් බදු තක්සේරු කළයුතු වේ. | වරිපනම් තක්සේරු සඳහා ඉල්ලීම් කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) 396 (ඇ) | නිකුත්කර මාස 06 ඉක්ම වූ රු.65,760 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| | (ii) 571(1) හා (2) | වර්ෂ 2 ක් ඉක්මවූ රු.9,744,812 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | වර්ෂ දෙක ඉක්ම වූ තැන්පතු ශේෂය ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 1980 දෙසැම්බර් 31 දිනැති පලාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 දරන චක්‍රලේඛය | කඩ කාමර 356 කින් වසර 05 කට වරක් නව තක්සේරු වාර්තා ලබාගෙන තිබුණේ උප කාර්යාල 02 කට අදාල කඩ 108 කට පමණි. | වසර 05 කට වරක්වත් කඩ කුලිය තක්සේරු කළයුතු වේ. | කඩකුලී තක්සේරුව සඳහා යොමු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,299,307 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,574,937 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට පැවත එන රු.25,000 ක් වටිනා අගරු චෙක්පතක් නිරවුල් කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | අගරු චෙක්පත සඳහා මුදල් අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | මේ තුලින් ආයතනයට මූල්‍ය පාඩුවක් වී නොමැත. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 27,824,000 | 29,744,802 | 30,296,026 | 24,794,194 | 26,326,000 | 30,025,147 | 29,610,416 | 27,194,998 |
| කුලී | 27,852,000 | 20,097,604 | 20,164,792 | 1,674,408 | 16,421,000 | 17,390,062 | 18,623,858 | 1,401,952 |
| බලපත්‍ර ගාස්තු | 1,305,000 | 1,426,674 | 1,426,674 | - | 1,723,000 | 1,507,520 | 1,710,478 | - |
| වෙනත් ආදායම් | 99,927,000 | 100,263,916 | 78,737,842 | 122,676,645 | 85,185,000 | 85,045,651 | 104,317,836 | 105,270,206 |
| | 156,908,000 | 151,532,996 | 130,625,334 | 149,145,247 | 129,655,000 | 133,968,380 | 154,262,588 | 133,867,156 |

2.3.2 **කඩ කුලී**

----------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වේයන්ගොඩ උප කාර්යාලයට අයත් කඩ කාමර 27 කින් අයවිය යුතු වර්ෂ 10 කට වඩා පැරණි රු.3,863,080 ක් වූ පෙර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙර මුදල් අයකර ගතයුතු වේ. | කඩකාමර සඳහා ගිවිසුමක් නොමැතිවීම හේතුවෙන් සන්තකය ආපසු ගැනීම යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | වේයන්ගොඩ උප කාර්යාලයට අයත් කඩ කාමර 42 කින් සහ එගොඩපොත උප කාර්යාලයට අයත් කඩ කාමර 82 කින් වර්ෂ 1 ත් 5 ත් අතර කාලයකට අදාලව අයවියයුතු වෙළඳ ස්ථාන කුලී රු.1,609,587 ක් විය. | හිඟ කුලී අයකිරීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කළයුතු වේ. | එකී හිඟ මුදල අයකර ගැනිම සඳහා නෛතික ක්‍රියාමාර්ග සඳහා ප්‍රවේශ වෙමින් පවති. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 17 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | කාරණා 19ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකසා ගත යුතුය. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉටුකළයුතු කාර්යයන් සියල්ලම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරගෙන අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගතයුතු වේ. | ක්‍රියාකාරී සැලසුම් පිලියෙල කර කඩිනමින් ඉදිරිපත් කරනු ලැබේ. |

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය අනුව ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 – 2022 දක්වා පමණක් පිලියෙලකර තිබුණි. දුගී ජනතාවට සහනාධාර දීම යටතේ දිළිඳු පවුල් 14 කට සෙවිලි තහඩු ලබාදීමට හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම යන ක්‍රියාකාරකම් සිදුකර නැත. නිට්ටඹුව ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය හා එතුල වෙළඳසැල් පිහිටුවීම ආදිය ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් අදාල කාලපරිච්ඡේදයන් තුලදී ඉටුකළයුතු වේ. | එම තිරසර සංවර්ධන ඉලක්ක සැලැස්මේ ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රජා මණ්ඩලවලට බෙදාදීම සඳහා 2019 අගෝස්තු මාසයේදී මිලදී ගත් රු.690,030 ක් වටිනා පුටු 615 කින් බෙදා හැර තිබුණේ පුටු 50 ක් පමණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව මිලදීගැනීම හා කාලීනව නිකුත්කිරීම් සිදුකළයුතු වේ. | ඉදිරියේදී එම ඉතිරි පුටු ප්‍රජා මණ්ඩල සඳහා බෙදා දිමට පියවර ගනු ලැබේ. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් පරීක්ෂක තනතුරු 04 ක් 2010 සහ 2015 වර්ෂවල සිට ද ප්‍රාථමික අංශයේ තනතුරු 11 ක් 2019 වර්ෂයේ සිටද පුරප්පාඩු වී තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළයුතු වේ. | ප්‍රාථමික අංශයේ පුරප්පාඩු පිරවීම මැතිවරණ කටයුතු අවසන් වූ පසු සිදු කරනු ලැබේ. |
| (ආ) | කළමනාකරණ සහකාර සේවයේ එක් තනතුරක් හා තාක්ෂණ නිලධාරි තනතුරක් 2018 වර්ෂයේ සිට අතිරික්තව පැවතුණි. | අතිරික්ත තනතුරු අනුමත කරගැනීමට කටයුතු කළයුතු වේ. | එක් තාක්ෂණික නිලධාරී තනතුරක් අතිරික්තව ඇත. |

(ඇ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 1-10 ත් අතර කාලයක සිට අය නොවී පවතින සේවක ණය රු.179,231 ක් විය. | ණය ශේෂ කඩිනමින් අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම ණය ශේෂ අතර රු.16,337 ක මුදලට අදාල එක් අයෙකුගේ තොරතුරු සොයා ගත නොහැක. |

3.4 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු ඉඩම් 71 ක මායිම හඳුනාගෙන ආරක්ෂක වැටවල් සකස් කිරීමට කටයුතුකර නොතිබුණි. | සභා සතු ඉඩම් සඳහා ආරක්ෂිත වැටවල් සකස් කළයුතු වේ. | ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරනු ලැබේ. |

3.5. **ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිකිරීම් පරීක්ෂාව | | |
| පළාත් සභා අරමුදලින් රු.748,770 ක වියදමක් දරා සංවර්ධනය කර තිබූ උඩුගොඩ ගොරක ළිඳ කිසිවකු පරිහරණය නොකරන ළිඳක් වූ බැවින් මේ සඳහා දරා තිබූ වියදම ඵලදායී නොවූ වියදමක් විය. | ඵලදායී කාර්යයන් සඳහා සහා අරමුදල් යෙදවීම සිදුකළයුතු වේ. | නියං සමයකදී ජනතාවට මෙම ළිඳ භාවිතා කල හැකි පරිදි ප්‍රජා මණ්ඩල සහයෝගය සහිතව පවිත්‍ර කිරීමට කටයුතු කරනු ලැබේ. |